
# 05 විශ්‍රාම ගිය මුල්ගුරුතුමා

මෙහි දැක්වෙන්නේ, **සෝමවීර සේනානායක මහතා** ලියූ රසවත් කෙටිකතාවකි. මෙවැනි කෙටිකතා කියවීම ඔබගේ රසඥතා වර්ධනය පිණිස හේතුවනවා මෙන් ම ජීවිතයට බොහෝ අත්දැකීම් එකතු වීමට ද ඉවහල් වේ.

තම විශ්‍රාම ගැනීමේ උත්සවයේ කතාවක් පවත්වන්නට ගිය සේනාරත්න මුල්ගුරුතුමාගේ කටින් හඬක් පිට නොවී ය. කෝට් එකේ උඩ සාක්කුවේ මලක හැඩයට නමා තිබූ ලේන්සුව ගත් ඔහු මුහුණ පිස දමන්නට වූයේ තුන්කාංසෙන් දඩිය පෙරෙන්නට වූ බැවිනි.

උත්සව සභාවේ ඉස්සරහින් ම සිටින දෙකේ තුනේ පන්තිවල ළමයින් ඇස්, කන් ඇරගෙන බලා සිටිනු ඔහුට පෙනේ. හෝඩියේ පටන් අටේ පන්තිය දක්වා හැම සිසුවෙක් ම සිසුවියක් ම රැස්වීමට පැමිණ සිටිති. පිළිගැනීමේ ගීතය ගැයූ හතේ පංතියේ ගැහැනු ළමයි පස් දෙනෙක් ළමා සාරි හැඳ එකත්පස් ව බලා සිටිති.

සුදු රෙද්ද ඇඳ සකස් කර ගත් සේනාරත්න මුල්ගුරුතුමා දැත් කෝට් සාක්කු දෙකෙහි ඔබා ගත්තේ ය. කෙසේ හෝ කතා කළ යුතු යැයි ඔහුට සිතිණ. ඔහු වේදිකාව දෙස හැරී බැලුවේ ය. මාණ්ඩලික අධ්‍යාපන නිලධාරිතුමා, පාඨශාලා පරීක්ෂකතුමා, ගම් සභාවේ සභාපතිතුමා, වෙද මහතා, ග්‍රාම සේවක මහතා හා විශ්‍රාමලත් ගම්මුලාදෑනි තැන එහි අසුන් ගෙන සිටිති. අනෙක් පැත්තේ පාසලේ ආචාර්ය මණ්ඩලය යි.



"ප්‍රිය ශිෂ්‍ය ශිෂ්‍යාවනි" ඔහු වචන කීපයක් එළියට දමා ගත්තේ ය. ඉක්බිති ව ඔහු වේදිකාවේ සිටින සියලු දෙනාගෙන් ම අවසර ගත්තේ ය. කළ යුතු කතාව කල් තියා හිතෙන් සූදනම් කර ගෙන සිටියත් මේ අවස්ථාවේ මොනවා කතා කරන්න දැයි ඔහුට තේරුම් බේරුම් කර ගත නො හැකි ය.

ගත වූ අවුරුදු තිස් පහක දීර්ඝ කාලයක් තිස්සේ සේනාරත්න මුල්ගුරුතුමා මෙවැනි ශිෂ්‍යයන් ඉදිරියේ දිනපතා ම කතා කළේ ය. ඔහුට ඒ සඳහා කලින් සූදනම් වීමක් අවශ්‍ය නොවීය.

සේනාරත්න මුල්ගුරුතුමා අමාරුවෙන් කතාව පටන් ගත්තේ ය. ඔහු වචනෙන් වචනෙට කතාව නැවැත්වී ය. රැස් ව සිටි සියල්ලෝ ම අත්පොළසන් දුන්හ.

ඊළඟට තව කථිකයෙක් සේනාරත්න මහතාගේ ගුණ කියන්නට පටන් ගත්තේ ය.

සේනාරත්න මහතා පුටුවේ වාඩි වී දාඩිය පිස දමමින් තමා කතා කළේ මොනවාද'යි කල්පනා කරන්නට විය. ඔහුට එක වචනයක්වත් සිහිපත් කර ගත නො හැකි ය. ළමයින් ඉදිරියේ පවත්වන අන්තිම කතාව හරබර ව කර ගන්නට බැරි විණැයි ඔහු තුළ කනගාටුවක් හට ගත්තේ ය. ඔහු බිම බලා ගෙන රැලි කොට ගත් නළල දකුණතින් අත ගෑවේ ය. දාඩිය අහුරක් අතට විත් සුදු රෙද්දට ද වැටිණ.

"සේනාරත්න ලොකු ඉස්කෝලෙ මහත්තය මුළු ජීවිතේ ම මේ ඉස්කෝලෙ වැඩට කැප කරල තිබුණේ" කථිකයා කීවේ ය.

සේනාරත්න මහතා හිස ඔසවා ඒ කවුද'යි බැලී ය. ගම්සභාවේ මැම්බර් මහතා ය. ඒ කතා කරන්නේ. ඔහු ජයරත්නයි. ජයරත්න තම ශිෂ්‍යයකු ව සිටි බව සේනාරත්න මහතාට මතක් විය.

ජයරත්න වේගයෙන් කතා කරයි. වරින් වර අත්පොළසන් හඬ නැගේ. රැස්වීමට ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවෝ රැසක් ම පැමිණ සිටිති. ඔවුන්ගේ මුහුණු හඳුනා ගැනීමටත්, නම් සිහි කිරීමටත් සේනාරත්න මහතා උත්සාහ කළේ ය.

රැස්වීමේ ඉදිරි ම පෙළේ අසුන්වල සේනාරත්න මහතාගේ බිරිඳ ගුණවතී ඉස්කෝලෙ හාමිනේත්, පුත්තු දෙදෙනාත්, දුවත් සිටිති. ඊට පසුපසින් සේනාරත්න මහතාගේත්, ගුණවතී ඉස්කෝලෙ හාමිනේගේත් නෑදෑ හිතවත්තු ය. ඔවුන් හැම දෙනා ම දෙස සේනාරත්න මහතා බැලුවේ ය. තිස් පස් වසරක තම සේවය ඔවුන් ඉදිරියේ විස්තර වීම ගැන ඔහු සන්තෝෂ විය.

සවස හතර හමාර වන විට රැස්වීම අවසන් විය. ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවෝත්, වර්තමාන ශිෂ්‍ය ශිෂ්‍යාවෝත් පේළියට අවුත් බුලත්හුරුලු දී සේනාරත්න මහතාට වඳින්නට වූහ. ඔහු බුලත්හුරුල්ල තම'තට දී දණ ගසා වඳින සිසුන්ගේ හිස් අත ගෑවේ ය. විසි දෙනෙකුගෙන් පමණ වැඳුම් ලබන විට ඔහු තුළ දැඩි ශෝකයක් හට ගත්තේ ය. තව හාර පන්සියයක් පමණ බුලත්හුරුලු සූදනම් කරගෙන හෙමින් හෙමින් එති. තමා ඔවුන්ගෙන් වෙන් වී යයි සේනාරත්න මහතාට සිතිණ. තම පියාගේ මළගෙදර දා හැම දෙන ම බුලත්හුරුලු දී තමාට කතා කළ අයුරු ඔහුට මතක් විය. එදාත් මේ තරම් ම බුලත්හුරුලු තොගයක් ලැබිණ.

රැස්වීම නිම වී හැම දෙන ම ආපසු යන්නට වූහ. සේනාරත්න මහතාගේ දරුවනුත් ඒ වන විට මඳ දුරක් ගොස් ය. උත්සව සංවිධායකයෝ තුන් හතර දෙනෙක් පමණක් ගොඩනැගිල්ලේ එහා කෙළවරේ කතා බස් කරමින් සිටිති. ගුණවතී ඉස්කෝලෙ හාමිනේ තම සැමියා දෙස බලා "යමු" යි කීවා ය.

සේනාරත්න මහතා හෙමින් හෙමින් පිය නගන්නට විය. පාරේ දුවගිය ළමයින් දෙදෙනෙකු කැඳවූ ඉස්කෝලෙ හාමිනේ බුලත්හුරුලු සියල්ල ගෙදර ගෙනෙන්නැ'යි අණකොට සැමියා සමග පිය නගන්නට වූවා ය. සේනාරත්න මහතා දෑත් පිටුපසට බැඳ හිස නමාගෙන හෙමින් හෙමින් ගැටුවේ ය.

ගෙදර තිබුණේ ඉස්කෝලෙ වත්ත අයිනේ ය. ඒ ඉඩම එතුමා මිල දී ගත්තේ විවාහයට වසරකට පෙර ය. විවාහයෙන් පසු ඔහු කුඩා ගෙයක් තැනුවේ ය. කෙමෙන් ලොකු කළ ගෙය දැන් ගමේ විශාල ම ගෙයයි.

කර බා ගෙන ගෙට ගොඩ වූ සේනාරත්න මහතා කන්තෝරු කාමරයට ගොස් ජනේලයෙන් පිටත බැලුවේ ය. මෙතැනට ඉස්කෝලය පෙනේ. ඔහු ගෙය හැදුවේ ඉස්කෝලය පෙනෙන පරිද්දෙන් ම ය. වැඩ නිම වී හවස පැමිණි විට ද ඉස්කෝලය පෙනෙන්න තිබිය යුතු යයි ගෙය හදද්දී සිතුවේ ය. ඇතැම් විට වැට අස්සෙන් රිංගන හරක් ඉස්කෝලෙ වත්තට ඇතුළු වී ආලපාළු කර දමති. ළමයින් විසින් ගෙවතු වැඩ වෙලාවල දී වවන මල් හා එළවළු ඉස්කෝල වත්තේ තැනින් තැන ඇත. එක හරකෙකු රිංගුවොත් සියල්ල විනාශ වෙයි. සේනාරත්න මහතා මේ හැම දෙයක් ගැන ම සෝදිසියෙනි සිටියේ.

සුදු කෝට් එක ගලවා ගෝන අං තට්ටුවේ එල්ලූ සේනාරත්න මහතා දාඩියෙන් තෙමුණු අත් දිග මේස් බැනියම ගලවා මිදුලේ වැලට දැමුවේ ය. කළු පටිය ගලවා සුදු රෙද්ද ද ලිහා දැමූ ඔහු යටට හැඳි සුදු සරම කැසපට කවා ඉස්තෝප්පුවේ හාන්සි පුටුවේ ඇල වී දෑත් හිසේ බැඳ ගත්තේ ය.

ඉස්කෝලේ ශාලාවේත්, ඊට යාබද බුදුමැදුරේත් වහල මෙතැනට පෙනේ. සමර ගෑ කණු මත කළු පැහැති උළු වහල රැඳී ඇත. අවුරුදු ගණනාවක් තිස්සේ වට වැස්සෙන් බැඳී දිය සෙවෙල රැඳුණු වහලේ ඉඳහිට අලුත් උළුකැටයක් දෙකක් ඇස ගැසේ. ඒ බිඳුණු කැට වෙනුවට අලුතෙන් සෙවිලි කළ ඒවා ය. ඒ උළුකැට සෙවිලි කළෙත් සේනාරත්න මහතා ම ය. උළුකැටයක් බිඳුණු විගස ඉණිමග වහලට හේත්තු කර සරම කැසපට කවා වහලට නගින ඔහු තම බිරිඳගේ හෝ දරුවන්ගේ හෝ සහායෙන් බිම ඇති උළු කැට ගෙන සෙවිලි කළේ ය. ගෙදර වහලයේ බිඳුණු අලුත් උළුකැටයක් මාරු කිරීමට සේනාරත්න මහතා එතරම් උනන්දු වූයේ නැත. ඇතැම් දිනෙක ගුණවතී ඉස්කෝලෙ හාමිනේ මේ ගැන සැමියාට සරදම් කළා ය. "මහත්තයගේ ගෙදර මේක නෙමෙයි ඉස්කෝලෙ. දැන් අපි ඉන්නේ ඇඳකුත් ගෙනිහිං තියන්ඩ."

තමා උපගුරුවරයෙකු වශයෙන් ගුරුගල්ලේ ඉස්කෝලයට පැමිණි අයුරු ඔහුට මතක් විය. එකල ඔහුගේ වයස අවුරුදු විස්සකි. පොල් කොට සිටුවා ඒ මත ලීයෙන් තැනූ වහලයට පොල් අතු සෙවිලි කළ ගොඩනැගිල්ලකි, එකල තිබුණේ. එහි පන්ති තිබුණේ බාලාංශයේ සිට හයේ පන්තියට පමණි. ළමයින් හැට දෙනෙකුට ගුරුවරු තිදෙනෙක් ඉගැන්වූහ. හයේ පන්තියේ සිටියේ ළමයි තිදෙනෙකි.

අනෙක් ගුරුවරුන් දෙදෙන මාරු වී ගිය පසු ය, සේනාරත්න මුල්ගුරුවරයා වූයේ. මාස තුනක් යන තුරු මුළු ඉස්කෝලෙට ම ඉගැන්වූයේ ඔහු පමණි. තමා මුල්ගුරු වූ පසු ඉස්කෝලය දියුණු වන්නට පටන් ගත්තේ යැයි සේනාරත්න මහතාට සිතෙයි. ගොඩනැගිලි දෙකක් අලුතෙන් ලැබුණේ ද පුද්ගලික පරිශ්‍රමයක ප්‍රතිඵලයක් වශයෙනි. දැන් ළමයි දෙසීයක් පමණ මෙහි උගෙනුම ලබති. ගුරු මණ්ඩලය ද අට දෙනෙකුගෙන් යුක්ත ය.

ගුණවතී ඉස්කෝලෙ හාමිනේ ඉගැන්වූයේ ගුරුගල්ලෙන් සැතැප්මක් එහා නාපාවල ඉස්කෝලේ ය. සේනාරත්න මහතාට ඇය මුලින් ම හමු වූයේ මාණ්ඩලික ගුරු රැස්වීමක දී ය. ඊට පසු ද දෙතුන් වරක් ම ඇය හමු වුව ද ප්‍රේම කිරීම ළමයින්ට නරක ආදර්ශයක් නිසා කෙළින් ම ඇගේ දෙමාපියන්ට යෝජනාව ඉදිරිපත් කළ අයුරුත් සේනාරත්න මහතාගේ මතකයට නැගිණ. විවාහයෙන් පසු ඈ මේ ඉස්කෝලයට ම ආවා ය. එයින් ගුරු මණ්ඩලයේ සංඛ්‍යාව ද වැඩි වීම ගැන සේනාරත්න මහතා සන්තෝෂ විය.

හාන්සි පුටුවේ දිගා වී ටික වේලාවක් කල්පනා කළ සේනාරත්න මහතාට සිතුණේ නැවතත් ඉස්කෝලෙ පැත්තට යා යුතු බව ය. විශ්‍රාම යාම පිළිබඳ කනස්සල්ලෙන් මිදෙන්න හොඳ ම මග එය යයි ඔහුට සිතිණ. ඔහු හෙමින් හෙමින් ඇවිද්දේ ය. වෙනදා නැති පාළුවක් ගොඩනැගිලි පුරාත්, වත්ත හැම තැනත් ඇතැයි ඔහුට සිතිණ. ඔහු උත්සවය

පැවැත්වුණු තැනට විත් දෑත් ඉණෙහි ගසා හිස කෙළින් කර බැලුවේ ය. කඩදාසි කැබලි, කඩල ගොටු, ගොක් කොළ තැනින් තැන විසිරී ඇත. පඩි පෙළ පාමුල ඇත්තේ ගොක් කොළයෙන් නැමූ ආරුක්කුවකි. ඒ දුටු ඔහුට මතක් වූයේ අවමඟුල්වල දී මිනී වළ වටා නමන ගොක් ආරුක්කුයි. තැන තැන විසිරි කඩදාසි තමා වෙනුවෙන් ගැසූ ශෝක ප්‍රකාශ වැන්න. ඇත්තට ම ඉස්කෝලෙ ජීවිතයෙන් තමා මිය ගියා නොවේ ද?

ඔහු නැමී එක් කඩදාසි කැබැල්ලක් අහුලා ගත්තේ ය. මගේ පාසල මාතෘකාව යටතේ ලියූ වාක්‍ය රචනයකි ඒ.

සේනාරත්න මුල්ගුරුතුමා ඉස්කෝලෙ ගොඩනැගිල්ලට ඇතුළු විය. ඔහු පාළු පන්තියක්, පන්තියක් පාසා ගොස් නැවති නැවතී බැලුවේ ය. ගොඩනැගිල්ලේ කොතැනින් වත් 'මීක්' සද්දයක් නැත. ළමයින්ගෙන් තොර ඩෙස් බංකු කරබාගෙන ඔහේ සිටියි. වෙනදාට ඒ ඩෙස් බංකු මත සිටින සිය ගණන් ප්‍රාණ තමා දෙස බලන්නේ කොතරම් ගෞරව සම්ප්‍රයුක්ත ව ද? සේනාරත්න මහතා ඕනෑකමින් පන්තිය දෙස බලා සිටියේ ය. එහි මුල්ලේ වක ගැසී සිටි නාකි කැහැටු බැල්ල හිස ඔසවා බලා නැවත ගුළි වූවා ය. ඇතැම් බංකුවක ඇති වැකි මඳ අඳුරේ වුව ද ඔහුට කියවිය හැකි ය. සිරිපාල පහේ කැලෑසිය, බනිස් වෙලාව එකොළහ හමාර. ඊට එහායින් 'කජු කිරියා' යයි කොටා ඇත.

සේනාරත්න මහතා බංකුවේ අත අතුල්ලා ඒ සටහන් මකන්න උත්සාහ කළේ ය. කුඩා පිහියකින් හාරා ඇති ඒ සටහන් මැකිය නො හැකි ය. කළුලෑල්ලක හැඳූ ගණනක් ද තව ම මකා නැත. මේ පන්ති භාර ගුරුවරියට අවවාද කළ යුතු යයි ඔහුට සිතිණ. ඒත් දැන් තමා රාජකාරිය නො කරන බව එකෙණෙහි ම ඔහුට සිහිපත් විය. ඔහු කළු ලෑල්ල ළඟට ගොස් සිට ගත්තේ ය.

"පොල් ගෙඩියක් සත විසිපහ නම් රුපියල් දෙකකට පොල් ගෙඩි කීයක් ගත හැකි ද?"

"අටයි" ඔහු තමාට ම කියා ගත්තේ ය. ඊට පසු අතින් ම කළුලෑල්ල මකා දෑත් එකට ගසා හුණු පිස දැම්මේ ය.

ඔහුගේ මේසය වූයේ එහා අයිනේ ය. ඔහු එතැනට ගොස් පුටුවේ ඉඳ ගත්තේ ය. බාල්කවල ලියූ ආදර්ශ පාඨ ඔහුගේ දෑසට හසු විය. ඒවා හුණු කැටයෙන් ලියන ලද්දේ තමා විසින් ම ය.

'සත වෙත මෙත් වඩමු', 'සතුනට හිංසා නො කරමු', 'ඉවසන දනා රුපු යුදයට ජය කොඩිය', 'නිති පන්සිල් රකිමු', 'හැදෙන ගහ දෙපෙත්තෙන් දනේ.'

අඳුර පැතිරෙන්නට වූයෙන් සේනාරත්න මහතා මිදුලට බැස්සේ ය. ඉස්කෝලේ එළවළු කොටුවේ සවි කළ පඹයා සුදු පැහැයෙන් පෙනේ. ඉස්කෝලෙ එළවළු වත්තේ ළිඳ ළඟට ගිය සේනාරත්න මහතා වතුර පනිට්ටු හත අටක් එළවළු කොටුවට ඉස්සේ ය.

ගෙදර සාලයේ එල්ලෙන පැට්‍රොමැක්ස් ලාම්පුවේ එළිය යම්තමට ඉස්කෝලෙ වත්තට වැටෙයි. ඉස්කෝලෙ වත්තෙ ඉතිරි හරිය මුළුමනින් ම අඳුරු ය. ඒ අඳුරේ වුව ද ඉස්කෝලයේ සුදු බිත්ති පෙනෙන්නේ පාළු කනත්තේ හොල්මනක් ලෙසිනි. වතුර පනිට්ටුවක් ඇද මුහුණ කට සෝද සරමෙන් ම පිසද ගත් එතුමා ගෙදර ගියේ ඉස්කෝලය දෙස හැරි හැරී බලමිනි.

ඔහුගේ බාල පුතාත්, දුවත් සාලයට වී පංච දමමින් සිටියහ. දුව පවුලේ බාලයා ය. ඇගේ වයස අවුරුදු දහතරකි. පුතුන් දෙදෙනාගෙන් වැඩිමලා විශ්වවිද්‍යාලයේ උගනියි. ඔහු එවේලේ පොතක් කියවමිනි සිටියේ. දෙවැන්නා මෙවර අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය ගනියි. සේනාරත්න මහතා ඔවුන්ගේ සෙල්ලම දෙස ටික වේලාවක් බලා සිටියේ ය.

"තාත්තට දැන් විවේකෙන් ඉන්න පුළුවන්. වයසට යනකොට විවේකය ඕනෑමයි" ලොකු පුතා පොතෙන් ඇස් ඉවතට නො යවා ම කතා කළේ ය.

"මට හිතිල තියෙනවා අහල පහළ ළමයි හවහට ගෙදරට ගෙන්නගෙන උගන්නන්ඩ" සේනාරත්න මහතා දරුවන් දෙස සන්තෝෂයෙන් බැලුවේ ය.

"ගමේ මිනිස්සුන්ට ඕව කරන්ඩ සල්ලි නෑ. ඊටත් කවුරුත් ලැහැස්ති වෙයි නිකං ඉගෙන ගන්ඩ."

"නිකං තමයි පුතා. සල්ලි දුන්නත් ගන්ඩ හොඳ නෑ. දන්න සාස්තරේ උගන්නනවා මිසක්" සේනාරත්න මහතා කීය.

තමා ඉස්කෝලෙට ආ දා පටන් මේ දක්වා සියල්ල දරුවන් ඉදිරියේ දිග හැරීමේ ආශාවක් ඔහු තුළ හදිසියේ හට ගත්තේ ය. දරුවන් දන්නේ තොරතුරු බිඳකැ'යි ඔහුට සිතිණ. ඔවුන් දන්නේ තාත්තා බිම් එළිය වැටෙන්නත් පෙර අවදි වී මුහුණ කට සෝද පන්සිල් ගෙන අරඹන ජීවිතයෙන් අල්පයක් විය යුතු ය. පන්සිල් ගත් පසු පොතපත කියවා වත්ත පිටියේ ඇවිද බුලත් කොටු, එළවළු කොටු ගැන විමසා බලන තාත්තා ඊ ළඟට සුදු රෙද්දක්, සුදු කෝට් එකක් හැඳ ඉස්කෝලෙට යන බවත්, දවල් එකහමාරට ගෙදර එන බවත් ඔවුහු දනිති.

තමාගේ දින චරියාව මතක් වූ සැණෙන් ම සේනාරත්න මහතාගේ සිහියට ආවේ ගුරුගල්ලේ හතේ බාස් ය. තමා හැර වෙලාවට වැඩ කරන මේ ගමේ අනිත් මිනිහා හතේ බාස් ය. අවිස්සාවේල්ලේ කම්කරුවකු වන ඔහු වැඩක් ඇතත් නැතත් හරියට උදේ හතට ගෙදරින් පිට වී පයින් ම ඇවිද යයි. ඔහුට කියන්නේ හතේ බාස් කියා ය.

පංච පෙතේ පැත්තකින් හිඳ ගත් සේනාරත්න මහතා දරුවන් ඉදිරියේ අතීතය තැනින් තැන දිග හැරියේ ය. "උඹලත් සේවයට ම කැප වෙන්න ඕන" ඔහු අන්තිමට අවවාද වශයෙන් කීවේ තම කතාව කිසිවකු අසා නො සිටි බැවිනි.

නිවාඩු කාලයෙන් පසු ඉස්කෝලය පටන් ගැනිණ. තව ම විශ්‍රාම නො ගිය ගුණවතී ඉස්කෝලෙ හාමිනේ හැඳ පැලඳ ඉස්කෝලයට ගියා ය. දරුවන් ද ගොස් ඇති බැවින් ගෙදර ඉතිරි වූයේ සේනාරත්න මහතා පමණි. ඔහු හැම ද ම උදේට කරන එළකිරි බාගයක් බීම එදාත් කර හතට ගේ ඉදිරිපිට කඩුල්ල ළඟ සිට ගත්තේ ය. පොත් තුරුලු කර ගත් පුංචි පුංචි ළමයි ඉස්කෝලෙ එති. ඒ කීයේ පන්තියේ ළමයි විය හැකිද'යි තේරීමට ඔහු උත්සාහ කෙළේ ය. ළමයි දෙකේ වෙන්නැති. ආන් අර ළමය හතේ. ඇතැම් සිසුවන් අත බුලත්හුරුලු ඇත. ඒ අලුත් මුල්ගුරුවරයාට කතා කිරීමට ය. බුලත්හුරුලු දකිත් ම ඔහුට සිහි වූයේ තම විශ්‍රාම උත්සවයයි. ඔහුගේ හිතේ දුකක් ඇති විය. තමා ඔවුන්ගෙන් වෙන් වූවා නොවේ ද?

ඉස්කෝලයෙන් නැගෙන ඝෝෂාව පොදි පිටින් විත් සේනාරත්න මහතාගේ කන් පතුලේ වදියි. උච්චි....... උච්චි......... තෝල්......... උච්චි.......... උච්චි........ තෝල්........ ටයිටාරන්, රයිට්. ටයිටාරන්......... රයිට්. මේ කොයි යන්නේ රයිගම් යන්නේ. මෙතනින් කඩන්. යකඩ කඳන්. උඩින් පනින්. තල්ල කැඩෙයි.

හැම ළමයෙකු ම සෙල්ලම් කරනු ඇසේ. ඒ හඬ අවුරුදු තිස් පහක් මුළුල්ලේ තමාට ඇසුණා නොවේ දැයි ඔහුට සිතිණ.

අටේ පංතියේ පිරිමි ළමයින් හතර දෙනෙකු වතුර බාල්දි ගෙන එනු පෙනේ. සිරිවර්ධන ඉස්කෝලෙ මහත්තයා වේට්ටිය මඳක් කැටි කොට ගෙන යාලගම පැත්තේ සිට නියරක් දිගේ එයි.

බාල සොහොයුරෙකුත් ඇදගෙන ශිෂ්‍යාවක් පාර දිගේ එමින් සිටියා ය. පොඩි දරුවා හෝඩියේ විය යුතු ය. ඔහු හඬමින් ඇද්දි ඇද්දී එයි. හැට්ට කටුවක් ගසා කමිසයේ එල්ලූ ලේන්සුවෙන් වරින් වර කඳුළු හා හොටු පිහින ඔහු තමා දැක හැඬීම නවත්වනු සේනාරත්න මහතා දුටුවේ ය.

සීනුව නාද විය. ඒ හඬ කිසි දා නො ඇසුවාක් මෙනි, ඔහු තිගැස්සී බැලුවේ. ළමයි බුදු මැදුර ඉදිරිපිට පෙළ ගැසෙති. අලුත් මුල්ගුරුවරයා වන අමරසිංහ මහතා ඔවුන් ඉදිරිපිට සිට ගනු සේනාරත්න මහතා බලා සිටියේ ය. ජාතික ඇඳුම ඇඳ සිටින ඔහු තමාට වඩා තරුණ ය. ඔහු කියන්නේ මොනවා දැයි අසා ගැනීමට සේනාරත්න මහතා තුළ වූයේ කුතුහලයකි. ළමයින්ට හොඳ අවවාද ටිකක් දුන්නොත් හොඳ ය. සේනාරත්න මහතා  කම්බි වැට අයිනට ම ගියේ ය. ඒත් කිසිවක් නො ඇසේ. සියඹලා ගහට හේත්තු වී ගහේ කඳ නියපොතු ගසමින් ටික වේලාවක් බලා සිටියේ ය. ගෙය එහෙම පිටින් ම හිස් ය. කිසි ම හාවක් හූවක් නැත. ගල් ගිල්ලා වගේ ය. ඔහු කාමරයක් පාසා ඇවිද්දේ ය. ඔහු තුළ දැඩි ශෝකයක් හට ගැනිණි. සාලයේ පුටුවක වාඩි වූ ඔහු දෑතින් ම ඇස් පොඩි කරන්නට විය.

ඉස්කෝලෙ පැත්තේ යා යුතු ය යන සිතිවිල්ල ඔහු තුළ බලවත් ව නැගිණ. කන්තෝරු කාමරයට ගිය ඔහු ජනේලයෙන් පිටත බැලී ය. කජු ගහ ළඟ රවුමක් සෑදුණු ළමයි කවි කියති. ගුණවතී ඉස්කෝලෙ හාමිනේ රවුමේ යමින් කවි උගන්වයි.

සේනාරත්න මහතා සුදු සරමට උඩින් සුදු රෙද්ද හැඳ කළු පටිය බැඳ ගත්තේ ය. කෝට් එක ද දා ගත් ඔහු කම්බි වැට ළඟට ගොස් මඳක් නැවතුණේ ය. මොහොතකින් කම්බිය අස්සෙන් රිංගා ඉස්කෝලෙ වත්තට ආවේ ය. කුලුපග මිතුරන් රැසක් මැදට ආ කලක ඇතිවන හැඟීම ඔහු තුළ ඇති විය. බාගෙට කට ඇරගෙන සිනාසෙමින් සන්තෝෂයෙන් වටපිට බැලුවේ ය. ළමයි හැරි හැරී ඔහු දෙස බැලූහ. ඔහු දෙකේ පංතිය ළඟට ගොස් නැවතුණේ ය.

**"පඳුරු උඩින් බෝවා**
**විදුලි කෙටිලි පෑවා**
**කොළ සර බර ගෑවා**
**බිරූ කටත් ආවා"**

ළමයි තාලයකට කවි කියති. සේනාරත්න මහතා හිස වන වනා ඒවා අසා සිටියේ ය. කවියේ මාත්‍රා තුනෙන් තුනට හා දෙකෙන් දෙකට ශ්‍රැතිය ඇත. ඒ කවිය වෙනත් අයුරකට කිව නො හැකි දැයි සිතූ ඔහු හිතෙන් ගායනා කර බැලී ය.

සේනාරත්න මහතා තව පන්තියක් ළඟට ගියේ ය. ඔහු තුළ සන්තෝෂය උතුරා යමින් තිබිණ. ඔහු විලුඹ ඔසවා ඇඟිලිවලින් පමණක් ඇවිද්දේ ය. දෑත් පිටුපසට බැඳ හොලව හොලවා වටපිට බැලුවේ ය.

ඔහු බිත්ති කන්දට උඩින් කුඩා සිසුවෙකුගේ ගල්ලෑල්ලට එබී බැලී ය. ගස් වර්ග යනුවෙන් උඩින් ලියා ඇත. පොල් - කිතුල් - රඹුටන් - මල් ඔහු සිසුවා ළඟට ගොස් ඔළුව අත ගෑවේ ය.

"මල් කියන එක මකල දන්ඩ. මල් ගස් හුඟක් තියෙනව. මකලා මල් ගස්වල නම් වෙන ම ලියන්ඩ. මොනවද මල් ගස්වල නම්?"

සේනාරත්න මහතා සිසුවාගේ හිස මත අත තබා වටපිට බැලුවේ ය. අලුත් මුල් ගුරුවරයා කණ්ණාඩිය උඩින් බලා සිටිනු දුටු සේනාරත්න මහතා ඔහු සමග ද සිනාසී නැවතත් සිසුවා දෙස බැලී ය.

"අරලිය........ සීනිද්ද........ පොල්, තව බළල්නකුට, තව පරසතු තව ....." සිසුවා මල් වර්ගවල නම් කීවේ ය.

"බොහොම හොඳයි"

සේනාරත්න මහතා අනිත් පංතියක් ළඟට ගොස් සිට ගත්තේ ය. ගුරුවරියක් එහි උගන්වමින් සිටියා ය.

**"මදුමල් ගමේ මල්හාමි පොහොසතෙකි"** ගුරුවරිය කවියක් කියයි.

"ඕව වගේ ම ලෝවැඩ සඟරාවෙ කවිත් උගන්නන්ඩ. දැන් මේ බලන්ඩ **සෙත් සිරි දෙන මහ ගුණ මුහු දනන් සත් හට වන බව........"**

සේනාරත්න මහතා සිනාසුණේ ය. අනතුරු ව සන්තෝෂයෙන් හිස වැනුවේ ය.

සේනාරත්න මහතා ඊට පසුදාත් හැඳ පැලඳ සූදනම් වී පෙර පරිදි ම ඉස්කෝලයට ආවේ ය.

## ක්‍රියාකාරකම 01

**කෙටිකතාව නිශ්ශබ්ද ව කියවා පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(i) මුල්ගුරුතුමාගේ චරිතයේ ඔබ දකින විශේෂ ලක්ෂණ මොනවා ද?

(ii) මුල්ගුරුතුමාගේ විශ්‍රාම උත්සවය සඳහා සහභාගි වූ අය නම් කරන්න.

(iii) උත්සව සභාවේ දී, විශ්‍රාමික මුල්ගුරුතුමාට කතා කිරීමට නො හැකි වූ කරුණ පිළිබඳ ව ඔබගේ අදහස් දක්වන්න.

(iv) ජයරත්න මැම්බර් මහතා විශ්‍රාමික මුල්ගුරුතුමාගේ සේවය අගය කළ ආකාරය උපුටා දක්වන්න.

(v) මෙම කෙටිකතාවේ සඳහන් පාසලේ සිසුන් සතු සාරධර්ම පිළිබඳ ව උදාහරණ සහිත ව කරුණු දක්වන්න.

(vi) **"මුල්ගුරුතුමා පාසල පෙනෙන පරිද්දෙන් තම නිවස ගොඩ නැගුවේ ය".** ඒ පිළිබඳ ව ඔබගේ අදහස් දක්වන්න.

(vii) **'සේනාරත්න මහතා රාජකාරියට ඇප කැප වූ ගුරු තරුවකි', 'පාසල හැර යාමට ඔහුගේ දෙපා වාරු නැත'** උක්ත අදහස් කෙටිකතාව ඇසුරෙන් පැහැදිලි කරන්න.

## ක්‍රියාකාරකම 02

**පන්තිය කණ්ඩායම්වලට බෙදී පහත සඳහන් ක්‍රියාකාරකම්වල යෙදෙන්න.**

(i) ගුරුගල්ලේ විදුහල පෙර තිබූ තත්ත්වයත්, එය දියුණු කිරීමට මුල්ගුරුතුමා කටයුතු කළ ආකාරයත් සසඳමින් කරුණු දක්වන්න.

(ii) සේනාරත්න මහතා විශ්‍රාම යාමේ කනස්සල්ලෙන් මිදීමට ක්‍රියා කළ ආකාරය දක්වන්න.

(iii) **'විශ්‍රාම ගිය මුල්ගුරුතුමා'** කෙටිකතාවේ තේමාව කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) මේ කෙටිකතාවේ දකින්නට ඇති කෙටිකතා ලක්ෂණ පිළිබඳ ව අදහස් දක්වන්න.

## ක්‍රියාකාරකම 03

01. **පන්තිය කණ්ඩායම්වලට බෙදී පහත දැක්වෙන ක්‍රියාකාරකම්වල නිරත වී අවස්ථාව ලැබුණ විට ඒවා ඉදිරිපත් කරන්න.**

**i. කණ්ඩායම**
සේනාරත්න මුල්ගුරුතුමාගේ විශ්‍රාම උත්සවයට ආරාධනා කිරීම සඳහා ආරාධනා පත්‍රයක් සකස් කිරීම. (විවිධ ද්‍රව්‍ය භාවිත කරන්න.)

**ii. කණ්ඩායම**
සේනාරත්න මුල්ගුරුතුමාගේ විශ්‍රාම උත්සවය පිළිබඳ ගුරුගල්ල ග්‍රාමවාසීන්ට දැන්වීම සඳහා දැන්වීම් පත්‍රයක් සකස් කිරීම. (ප්‍රසිද්ධ ස්ථානවල අලවන ප්‍රමාණයට)

**iii. කණ්ඩායම**
විශ්‍රාම උත්සව සභාවේ න්‍යාය පත්‍රය සකස් කිරීම.
(වේලාව සටහන් කළ යුතු ය)

**iv. කණ්ඩායම**
මුල්ගුරුතුමාගේ සේවය අගය කරමින් **'ගුරු අභිනන්දන'** නමින් සඟරාවක් සකස් කිරීම.
(කණ්ඩායමේ එක් එක් සාමාජිකයා විසින් මුල්ගුරුතුමා ගැන ලියන ලද කවි, ගීත, ලිපි, සුබ පැතුම් නිර්මාණය බැගින් එක් කරන්න)

**v. කණ්ඩායම**
ගුරු උපහාර ගීතය සකස් කිරීම.

## ක්‍රියාකාරකම 04

ඇල්මෙන් අකුරට ඇවිදින්
අකුරු ඇහිඳගෙන
කවි පදයක් එක් කරන්න පාසල් ගීයට
ඔබ මෙබිමෙන් අරගෙන යන
පස්පෙති මල් ඇට
යන්න ගිහින් පැළ කරන්න
ඔබ යන තැන්වල
ඒ බිජුවට දළු ලා මල්
පීදෙන දවසට
සුවඳ දූනේ සිය ගව් දුර
අප ඇති තැනකට

පද රචනය - රත්න ශ්‍රී විජේසිංහ

ඉහතින් දැක්වෙන්නේ ගුරුතුමකුගේ මුවෙන් නිකුත් වන උදන ගීතයක් වැන්නකි. එය අධ්‍යයනය කොට ගුරුතුමාට ඔබගෙන් පිදෙන ගී තිළිණය නිර්මාණය කරන්න.

## ක්‍රියාකාරකම 05

### සුබ පැතුම් හා සුබ පැතුම්පත්

සුබ පැතීම උතුම් මිනිස් ගුණයකි. ජීවිතයේ විවිධ අවස්ථාවල දී අපි ඔවුනොවුන්ට සුබ පතමු. එම සත් කාර්යය වාචික ව මෙන් ම ලිඛිත ව කළ හැකි ය. මෙය සුබ පැතුම්පත්, සුබ පැතුම් ප්‍රදර්ශක තිර මෙන් ම ගුවන් විදුලිය, රූපවාහිනී යන ජන මාධ්‍යවලින් ද විවිධ සුබ පැතුම් දකින්නට හා අසන්නට හැකි වේ. කවර සුබ පැතුමක් වුව ද ආකර්ෂණීය ව හා හෘදයංගම ව නිර්මාණය කළ යුතු ය. මෙහි දී සුබ පැතුමක පැවතිය යුතු ලක්ෂණ හඳුනා ගත යුතු ය. පහත දැක්වෙන්නේ ඒ සම්බන්ධ කරුණු කිහිපයකි.

- සුබ පැතුම්පත් විවිධ ද්‍රව්‍ය භාවිතයෙන් විවිධ හැඩයෙන් නිර්මාණය කළ හැකි ය.
- සුබ පැතුම් පාඨය/පද්‍යය/වගන්ති ආකර්ෂණීය, ආනන්දජනක හා උචිත විය යුතු ය.
- වඩා දීර්ඝ නොවිය යුතු ය.

සුබ උපන් දිනයක් වේවා!

මිතුරිය පබසරා,

ජීවිතේ මං පෙත
ඔබ තැබූ නව පියවර
පැහැසර සොඳුරු වන්නට
මේ සුබ පැතුම් ඔබ හට

සුරංජි මිතුරිය

සුබ නව වසරක් වේවා!

සතර බඹ විහරණ
පතළ කළ අප දිවියෙහි
මෑණියෙනි, පියාණෙනි
දයාබර සෙනෙහෙබර...

ලැබූ නව වසරෙහි
ලබා ජය, සැප, සුව
දිනේවා දිගුකල්
පතමු පා යුග සිඹ

සඳ’දර දුපුතුන්

**කණ්ඩායම් වශයෙන් බෙදී පහත සඳහන් ක්‍රියාකාරකම් දෙක බැගින් තෝරා ගෙන සුබ පැතුම්පත් නිර්මාණය කරන්න.**

(i) උපන් දින සුබ පැතුම්පතක් (පද්‍ය/පාඨ සහිත)

(ii) වෙසක්/නත්තල් හෝ වෙනත් ආගමික සුබ පැතුම් පතක් (පද්‍ය/පාඨ සහිත)

(iii) වීරෝදාර රණවිරුවන්ට සුබ පැතුම් පාඨයක්

(iv) ජගත් කීර්තියට පත් ව ශ්‍රී ලංකාවට පැමිණෙන ක්‍රීඩා ශූරයන්ගේ ජයග්‍රහණය සඳහා සුබ පැතුම් පාඨයක්

(v) විද්‍යාලයේ හොඳ ම ප්‍රතිඵල ගෙන දුන් තම සහෝදර ශිෂ්‍යයකුට/ශිෂ්‍යාවකට සුබ පැතුම් පාඨයක්

(vi) සේවයෙන් විශ්‍රාම ගිය ගුරු පියාණන්ට/මෑණියන්ට සුබ පැතුම්පතක් (පද්‍ය/ගද්‍ය පාඨ සහිත ව)

(vii) වෙළෙඳ ආයතනයක් විසින් තම සේවා දයකයාට පිරිනමන සුබ පැතුමක්

(viii) ජයග්‍රහණ හෝ උසස් වීමක් හෝ උදෙසා පිරිනැමෙන සුබ පැතුමක්

(උද :- ශිෂ්‍ය නායක තනතුරු ලැබීම්, සේවයෙන් උසස් වීම්, තරග ජයග්‍රහණ ආදිය සඳහා)

**සංකල්පනා**

ගුරු තරුව සෙමින් බැස යයි
ගැලූ එළිය නොයා නවතී යි
නුඹ කොපුල්තලා වැහි බිඳු තවරා
ගුරු තරුව සෙමින් බැස යයි

පරපුරක සිහින යාත්‍රා
තොටුපොළ යවා හරවා
පිතු සෙනේහයෙන්
ලොව කියා දුන්නු
ගුරු පාද පියුම් සුවඳ යි

එක මලක නම් නොවේ මැයි
මල් යායක සිරස නැමෙයි
පිතු සෙනේහයෙන්
ලොව කියා දුන්නු
ගුරු පාද පියුම් සුවඳ යි

පද රචනය : රත්න ශ්‍රී විජේසිංහ
ගායනය : පණ්ඩිත් අමරදේව